ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති උපාධි වැඩසටහන 2022/2023

අවසාන පරීක්ෂණය - 2022

**SNPA605 -** විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් සඳහා සංක්‍රාන්තිය

කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2024.02.26 වේලාව : පෙ.ව. 09.30 - ප.ව. 12.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න තුනකට(03) පිළිතුරු සපයන්න.

01. (i.) දුබලතා සහිත පුද්ගලයින්ගේ අධ්‍යාපන පනත (IDEA) තුළින් දුබලතා සහිත සිසුන්ගේ සංක්‍රාන්ති සේවා සහතික කරන ආකාරය කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 20)

(ii.) දුබලතා සහිත ළමුන් සඳහා අවශ්‍ය සංක්‍රාන්ති සැලැස්මක වැදගත් කරුණු පහක් (05) සඳහන් කර ඒ අතුරින් ශ්‍රී ලාංකික සන්දර්භය තුළ වඩාත් තීරණාත්මක වන කරුණු දෙකක් (02) ගවේෂණය කරන්න. (ලකුණු 40)

(iii.) ශ්‍රී ලංකාව තුළ සංක්‍රාන්ති ප්‍රතිපත්තියක් අවශ්‍ය වන්නේ මන්දැයි සුදුසු සාධාරණීකරණයන් සහිතව පරීක්ෂා කරන්න. (ලකුණු 40)

02. (i.) සංක්‍රාන්ති සැලසුම් ක්‍රියාවලියේ ප්‍රධාන අදියර හතර (04) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

(ii.) ඵලදායි සංක්‍රාන්තිය සඳහා ප්‍රධාන මූලධර්ම පැහැදිලි කරන්න. (ලකුණු 40)

(iii.) සංක්‍රාන්ති ක්‍රියාවලියට අනුව යම් කාර්යක් සඳහා පුහුණු කළ හැකි ඩවුන් සහ ලක්ෂණ සහිත දරුවෙකුට නිවසේ සිට පාසලට සහ පාසලේ සිට වැඩ ලෝකය සඳහා ද සංක්‍රාන්ති සැලැස්මක් සකස් කරන්න. (ලකුණු 40)

03. (i.) උදාහරණ දක්වමින් සංක්‍රාන්ති තක්සේරුවේ අර්ථය පැහැදිලි කරන්න. (ලකුණු 20)

(ii.) දුබලතා සහිත දරුවන්ගේ ශක්තීන් සහ දුර්වලතා තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි ඇගයීම් වර්ග පහක් (05) නම් කරන්න. (ලකුණු 40)

(iii.) දුබලතා සහිත දරුවන් හට ඔවුන්ගේ ස්වාධීන ජීවිත සවිබල ගැන්වීම සඳහා පවුල සහ පාසලේ කාර්යභාරය පරීක්ෂා කරන්න. (ලකුණු 40)

04. (i.) සංක්‍රාන්ති සැලැස්මකට ඇතුළත් කිරීමට අත්‍යවශ්‍ය වන සංක්‍රාන්ති සේවාවන්හි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 20)

(ii.) ශ්‍රී ලංකාවේ දුබලතා සහිත පුද්ගලයින් හට රැකියා සඳහා සූදානම් වීමේදී මුහුණ දෙන ගැටළු විශ්ලේෂණය කරන්න. (ලකුණු 40)

(iii.) **"වෘත්තීමය සහය"** තුළින් දුබලතා සහිත පුද්ගලයින් තරඟකාරී ශ්‍රම වෙළඳ පොළට සමෝධානිත කිරීමට හැකිය. එය ශ්‍රී ලංකාවේ සිදු කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 40)

**- සියළුම හිමිකම් ඇවිරිණි. -**